සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I,II

පැය 01.30

නම/විභාග අංකය :

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01.) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1.) පරිගණකයේ මූලික කාර්යය කුමක්ද?

i. ආදානය, සැකසීම, ප්‍රතිදානය
ii. ආදානය, ආචයනය, ප්‍රතිදානය
iii. දත්ත රැස් කිරීම, කළමනාකරණය, බෙදාහැරීම
iv. ආදානය, සැකසීම, ප්‍රතිචක්‍රීකරණය

2.) පරිගණකය තුළ සකස්කළ තොරතුරු පිටතට ලබා ගැනීම සඳහා භාවිතා කරන උපක්‍රමයක් (උපාංගයක්) වනුයේ,

i. මූසිකය (mouse)
ii. වෙබ් කැමරාව (Web Camera)
iii. රවුටරය (router)
iv. මුද්‍රණ යන්ත්‍රය (Printer

3.) ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ආරක්ෂාකාරීව බැහැර කිරීම සඳහා භාවිතා කරන 3R ක්‍රමයට අයත් නොවන පිළිතුර කුමක්ද?

i. Reduce
ii. Reuse
iii. Remove
iv. Recycle

4.) පිටුවක ඉහළ පහළ යාම සඳහා කළ යුත්තේ කුමක්ද?

i. මූසිකයේ වම් බොත්තම ක්ලික් කිරීම
ii. මූසිකයේ දකුණු බොත්තම ක්ලික් කිරීම
iii. මූසිකයේ රෝදය කරකැවීම
iv. මූසිකයේ වම් හා දකුණු බොත්තම දෙකම එකවර ක්ලික් කිරීම

5.) පහත සඳහන් මෘදුකාංග අතරින් ශ්‍රව්‍ය හා දෘශ්‍ය සංස්කරණ මෘදුකාංගය කුමක් ද?

i. Adobe Audition
ii. Audacity
iii. Adobe Premiere Pro
iv. Microsoft Paint

(3*5=15)

(02.) "අ" තීරයේ දැක්වෙන කාර්යයන් සඳහා භාවිතා කළ හැකි යතුරු "ආ" තීරයෙන් තෝරා යා කරන්න.

| "අ" තීරය | "ආ" තීරය |
|---|---|
| i කර්සරය එක් පේළියක් පහළට ගැනීම | TAB |
| ii වචන අතර තරමක විශාල හිස්තැනක් තැබීම | ARROW KEYS |
| iii කර්සරය ඉහල පහල ගෙන යාම | BACK SPACE |
| iv වචන අතර ඉඩ තැබීම | ENTER |
| v කර්සරය ඇති ස්ථානයට වම්පස අකුර මැකීම | SPACE BAR |

(3*5=15)

(03.) පහත ප්‍රශ්ණ සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(යෙදුම්, අංකිත උණකටුව, මධ්‍යම සැකසුම් ඒකකය, ඇන්ඩ්‍රොයිඩ්, අන්තර්ජාල බැංකුකරණය)

1. පරිශීලක අවශ්‍යතා සපුරා ගැනීමට සකසා ඇති මෘදුකාංග .............................................. මෘදුකාංග වේ.
2. .......................................... යනු ජංගමව භාවිතාවන මෙහෙයුම් පද්ධති සඳහා උදාහරණයකි.
3. .......................................... නිහිත පද්ධති සහිත උපාංගයක් වේ.
4. බැංකු පද්ධතිය තුළ පරිගණක භාවිතයේ නව ප්‍රවණතාවයක් ලෙස ......................................හැඳින්විය හැකිය.
5. ලබා දෙන උපදෙස්වලට අනුකූලව පරිගණකය තුළ දත්ත සකස් කිරීමේ ක්‍රියාවලිය ................................ මගින් සිදු කරයි. (3*5=15)

(04.) පහත සඳහන් ප්‍රකාශ හරි නම් "√" ලකුණ ද, වැරදි නම් "x" ලකුණද යොදන්න.

1. පරිගණකය ක්‍රියාත්මකව පවතින විට දත්ත, තොරතුරු හා උපදෙස් තාවකාලිකව රඳවා තබා ගන්නා උපාංගය ප්‍රධාන මතකය වේ. ( )
2. විශ්වාසවන්ත බව යනු පරිගණකයේ ලාක්ෂණික ගුණාංගයකි. ( )
3. යතුරුපුවරුව හා සංදර්ශකය යෙදුම් මෘදුකාංග භාවිතයට අවශ්‍ය මූලික මෙවලම් ද්විත්වය වේ ( )
4. ස්පර්ශ කළ නොහැකි දත්ත හා උපදෙස් අඩංගු වැඩසටහන් මෘදුකාංග වේ. ( )
5. 5 S ක්‍රමය යනු අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමේදී භාවිතා කළ හැකි එක් ක්‍රමවේදයකි. ( )

(3*5=15)

(05.) පහත ප්‍රශ්ණ සඳහා කෙටි පිළිතුරු සපයන්න.

i). a) පරිගණක භාවිතා කරන ක්ෂේත්‍ර 3ක් නම් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 3)

b) සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පරිගණකයේ භාවිතයන් 2ක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 4)

ii). a) නිවැරදිව පරිගණකය ක්‍රියාත්මක කිරීමේ පියවර 4 අනුපිළිවෙලින් ලියා දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 8)

b) පරිගණක විද්‍යාගාරය භාවිතා කිරීමේදී අනුගමනය කළයුතු ආචාර ධර්ම 3ක් ලියන්න.


..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 6)

iii)




a) A,B හා C අක්ෂර වලින් දැක්වෙන පරිගණක භාවිතයේදී අනුගමනය කළයුතු නිවැරදි ඉරියව් නම් කරන්න.

A……………………………………………………………………………………………………………..
B-……………………………………………………………………………………………………………
C-……………………………………………………………………………………………………………

(ල.6)

b) මින් B ඉරියව්ව පවත්වා නොගත් විට ඔබට මුහුණ පෑමට සිදුවන සෞඛ්‍ය ගැටලුවක් නම් කරන්න.

……………………………………………………………………………………………………………....
……………………………………………………………………………………………………………....
……………………………………………………………………………………………………………....

(ල.2)

iv) a) ශක්තිමත් පරිගණක මුර පදයක් ලියා දක්වන්න

……………………………………………………………………………………………………………....

(ල.5)

b) ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය යනු මොනවාද? හඳුන්වන්න.

..........................................................................................................................................................
..........................................................................................................................................................

(ල.4)

c) ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය වලින් නිකුත්වන පහත මූලද්‍රව්‍ය වලින් වැළඳිය හැකි රෝගය බැගින් ලියන්න.

..........................................................................................................................................................
..........................................................................................................................................................

(ල.4)

ලෙඩ් - ..........................................................................................................................

බෙරිලියම් - ........................................................................................................... (ල.2)

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I,II

පැය 01.30

නම/විභාග අංකය :

1.)

1. i 2. iv 3. iii 4. iii 5. iii

(3*5=15)

2). "අ" තීරුව "ආ" තීරුව

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| i. කර්සරය එක් පේළියක් පහලට ගැනීම | ENTER |
| ii. වචන අතර තරමක විශාල හිස්තැනක් තැබීම | TAB |
| iii. කර්සරය ඉහල පහල ගෙන යාම | ARROW KEYS |
| iv. වචන අතර ඉඩ තැබීම | SPACE BAR |
| v. කර්සරය ඇති ස්ථානයට වම්පස අකුර මැකීම | BACK SPACE |

(3*5=15)

3). 1 යෙදුම්
2. ඇන්ඩ්‍රොයිඩ්
3. අංකිත උණකටුව
4. අන්තර්ජාල බැංකුකරණය
5. මධ්‍ය සැකසුම් ඒකකය

(3*5=15)

4) 1.√ 2.√ 3.x 4.√ 5.√ (3*5=15)

(5) i). a). බැංකු
රෝහල
කර්මාන්තශාලා වැනි ගැලපෙන පිළිතුරු (ල 3)

b). දැඩි සත්කාර ඒකකය තුළ
ශල්‍යාගාරය තුළ
අංකිත උණකටුව වැනි ගැලපෙන පිළිතුරු (ල 4)

ii) a) 1. බිත්තියේ පරිගණකය සම්බන්ධ කර ඇති ස්විචය ක්‍රියාත්මක කොට විදුලි බලය ලබා දෙන්න
2. පරිගණකය නිර්බාධක ජව සැපයුමකට (UPS) සම්බන්ධ කර ඇත්නම් එය පණ ගැන්වීම
3. පද්ධති ඒකකය (CPU) පණ ගැන්වීම
4. සංදර්ශකය පණ ගැන්වීම (ල 8)

b) 1. අන් අයට බාධාවක් නොවන ලෙස පරිගණකය භාවිතය
2. අන් අයගේ පරිගණක ක්‍රියාකාරකම්වලට අනවසරයෙන් මැදිහත් නොවීම
3. ගුරු භවතුන්ගේ අධීක්ෂණයෙන් තොරව අන්තර්ජාලය භාවිත නොකළ යුතුය වැනි ගැලපෙන පිළිතුරු 3ක්

(ල.6)

iii

a) A,B හා C අක්ෂර වලින් දැක්වෙන පරිගණක භාවිතයේදී අනුගමනය කළ යුතු නිවැරදි ඉරියව් නම් කරන්න.

A - යතුරු පුවරුව සහ මූසිකය වැලමිට කෙලින් තබා ගත යුතුය.

B - ඇසත් පරිගණක තිරයත් අතර දුර අගල් 18 සිට 23 අතර ප්‍රමාණයක තබා ගත යුතුය.

C - කොන්ද කෙලින් තබා පුටු ඇන්දට හොඳින් හේත්තු වී වාඩි විට යුතුය. (ල.6)

b) මින් ඊ ඉරියව්ව පවත්වා නොගත් විට ඔබට මුහුණ පෑමට සිදුවන සෞඛ්‍ය ගැටලුවක් නම් කරන්න.

ඇසේ වේදනාව, නිතර කඳුලු ගැලීම, ඇස් පෙනීමේ දුර්වලතා (ල2)

iv) a) ශක්තිමත් පරිගණක මුර පදයක් ලියා දක්වන්න

ICTGrade6@ වැනි අකුරු, සංඛ්‍යා, සංකේත ආදියේ එකතුවක් (ල.5)

b) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය යනු මොනවාද? හඳුන්වන්න.

පරිගණක දෘඩාංග සියල්ලම ඒවායේ ක්‍රියාකාරී කාලය අවසන් වීමෙන් පසු හෝ භාවිත කරන්නා එය භාවිතයෙන් ඉවත් කළ විට ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ලෙස හඳුන්වයි. (ල.4)

c) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වලින් නිකුත්වන පහත මූලද්‍රව්‍ය වලින් වැළඳිය හැකි රෝගය බැගින් ලියන්න.

ලෙඩ් - මොලය, අක්මාව සහ රුධිර ධාවනයේ විකෘති

බෙරිලියම් - පෙණහැලි පිළිකා, හුස්ම ගැනීමේ අපහසුතා (ල.2)